ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media
No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2025.03.06**

| | |
|---|---|
| **03** | **09** |

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,
**පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

**ලෝක වකුගඩු දිනය නිමිත්තෙන් මාලිගාවත්ත, වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය මගින් ජනතාව දැනුවත් කිරීමේ අදිටනින් වැඩසටහන් රාශියක් ...**

ලෝක වකුගඩු දිනය සෑම වර්ෂයකම මාර්තු මස දෙවන බ්‍රහස්පතින්දා දින සමරනු ලබයි. මෙවර (2025 වර්ෂයේ) එම දිනය මාර්තු මස 13 වන බ්‍රස්පතින්දා දිනට යෙදී ඇත. "**වකුගඩු හොඳින් ද ? මුලින්ම හඳුනා ගනිමු. වකුගඩු වල සෞඛ්‍යමය තත්ත්වය ආරක්ෂා කර ගමු.**" තේමා කරගනිමින් මෙම වර්ෂයේ ලෝක වකුගඩු දිනය සමරණු ලබයි. ලෝක වකුගඩු දිනය ප්‍රථම වරට 2006 වර්ෂයේදී සමරනු ලැබීය.

මාර්තු මස 13 වන බ්‍රස්පතින්දාට යෙදෙන ලෝක වකුගඩු දිනය නිමිත්තෙන් මාලිගාවත්ත, වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය මගින් ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් වැඩසටහන් රාශියක් ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇති බව එම මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය චාල්ස් නුගවෙල මහතා සඳහන් කරයි.

ඒ අනුව මාර්තු මස 09 වන දින වකුගඩු රෝගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් විශේෂ පා ගමනක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇති අතර එම පා ගමන පෙරවරු 7.00 ට මාලිගාවත්ත රෝහල් පරිශ්‍ර යෙන් ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත.

මාර්තු 10 වනදා පෙරවරු 9.30 ට වකුගඩු සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍ය අනුපමා ද සිල්වා මහත්මිය විසින් රචිත පොත් එළි දැක්වීමේ විශේෂ වැඩසටහනක්ද පැවැත්වෙන අතර එය වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයේ ප්‍රධාන දේශණ ශාලාවේ පැවැත්වේ.

එමෙන්ම මාර්තු මස 14 වන පෙරවරු 9.00 ට කොළඹ 10, සෙරන්ඩිබ් ග්‍රෑන්ඩ් ශාලාවේ දී "**ත්‍යාගවන්ත වූ ජීවිතය චිරාභිවන්දනා**" නමින් වකුගඩු පරිත්‍යාගශීලීන් ඇගයීමේ විශේෂ වැඩසටහනක් ද සංවිධානය කර ඇත.

මෙම වැඩසටහන් වලට අමතරව වකුගඩු රෝගය පිළිබඳව ජනතාව මෙන්ම රෝගීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීමේ වැඩසටහන් රාශියක් පැවැත්වීමට ද සැළසුම් කර ඇති බව ද මාලිගාවත්ත, වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය චාල්ස් නුගවෙල මහතා වැඩිදුරටත් අවධාරණය කරයි.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත්කුමාර තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ)
සෞඛ්‍ය අමාත්‍යාංශය